කයිට්ස් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් 2015 වර්ෂයේ ගෙවියයුතු රු. 3,686,170 ක මුදල සඳහා විශ්‍රාම වැටුප් වෙන්කිරීම් කර නොතිබුණි. මේ නිසා සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පලාත් පාලන සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 96,946 ක් ආදායම් වියදම් ගිණුමේ සටහන් කර නොතිබීම නිසා වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පරිත්‍යාග වශයේ ලැබුණු රු. 28,167,600 ක් වටිනා වාහන 16 ක අයිතිය සභාවේ නමට මාරුකර ගෙන නොතිබූ අතර ඒවායේ වටිනාකම ගිණුම්වලට ගෙනවිත් තිබීමෙන් මොටර් වාහනවල වටිනාකම ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ලොරි බවුසරයේ අයිතිය සභාවේ නමට මාරුකර නොතිබූ අතර, එහි වටිනාකමද තක්සේරු කර නොතිබීමෙන් මොටර් වාහනවල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) රු. 885,000 ක් වැයකර ඉදිකරන ලද පොළ ගොඩනැගිලි ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3. ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
-------------------------------------------------

සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනය,ඉඩම් ගොඩනැගිලි ලේඛනය,හානිපාඩු ලේඛනය,ඉඩම් විකුණුම් බදු ලේඛනය,වීථි ලාම්පු ලේඛනය,ව්‍යාපාර බදු ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
-----------------------------------------------

සභාව විසින් ස්ථාවර වත්කම් ලේඛනය, ඉඩම් ගොඩනැගිලි ලේඛනය, හානිපාඩු ලේඛනය, ඉඩම් විකුණුම් බදු ලේඛනය, වීථි ලාම්පු ලේඛනය, ව්‍යාපාර බදු ලේඛනය යනාදි ලේඛන පවත්වා නොතිබුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>148(1) | වාහන සහ සතුන් සම්බන්ධයෙන් බදු පනවීමට ප්‍රදේශීය සභාවට බලය පවරා තිබුණද, එම වාහන සහ සතුන් සඳහා නියමිත බදු ප්‍රතිශතයක් අයකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>පරිච්ඡේදයේ II<br>රීති 4 | වරිපනම් බදු තක්සේරු කිරීම සහ වරිපනම් බදු අයකිරීම සභාව විසින් ඉටුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත්වල අත්සන් කිරීම සඳහා බලය ලබා ඇති නිලධාරින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 10,363,038 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 3,855,756 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,507,282 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 4,071,099 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 1,022,865 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 3,048,234 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 36,613,448 ක් වී තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 30,909,742 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 5,703,706 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

කොමසාරිස් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016<br>ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,302 | 3,014 | 8 |
| බලපත්‍ර ගාස්තු | 347 | 345 | - |
| වෙනත් ආදායම් | 43,158 | 38,498 | 6,143 |
| එකතුව | 45,807 | 41,856 | 6,151 |

2.4.2 වරිපනම් බදු

සභාව විසින් වරිපනම් බදු අයකර නොතිබුණි.

2.4.3 මුද්දර ගාස්තු

2011 වර්ෂයේ සිට 2016 වර්ෂ දක්වාවූ කාල පරිච්ඡේදයට අදාලව රු. 4,045,690 ක මුද්දර ගාස්තු ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයකරගෙන නොතිබුණි.

2.4.4 වෙනත් ආදායම්

සභාව විසින් සුසාන භූමි 16 කින් සුසාන භූමි බදු අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 82 ක්වූවද, තත්‍ය සේවක සංඛ්‍යාව 61 ක් බැවින් සේවක සංඛ්‍යාවේ ඌනතාවය 21 කි.

(ආ) රු. 885,000 ක් වටිනා ග්‍රාමීය පොළ මහජනයා විසින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වූවද, සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන කළමනාකරණ කමිටු රුැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

තේවරදම් බෝට්ටුව වර්ෂ 3 ක් ප්‍රයෝජනය ගෙන නොතිබුණි.

3.3 ප්‍රමාදවූ ව්‍යාපෘති

රු. 195,135 ක් වටිනා ව්‍යාපෘති නිමාකර නොතිබුණි.

3.4 අපද්‍රව්‍ය කළමනාකරණ

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමෙන් තොරව ගිණි තබා පුලුස්සනු ලැබේ.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යූහය

---------------

අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 110 සිට රු. 9,846,152 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරික්ෂණය විය.